වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2022

ஆண்டு செயல்திறன் அறிக்கை 2022

Annual Performance Report 2022

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12.
நீதிச் சேவைகள் ஆணைக்குழுச் செயலகம், கொழும்பு 12.
Judicial Service Commission Secretariat, Colombo 12.



වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2022

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය

පටුන

පිටු අංක

කෙටියෙදුම්.....03

01 - අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය හා ව්‍යුහය.....04-10

02 - ආයතනයේ ප්‍රගතිය හා ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග 11-21

03 - 2022 වර්ෂය සඳහා මූල්‍ය සමාලෝචනය.....22-37

04 - කාර්ය සාධන දර්ශක.....38-41

05 - තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය.....42-43

06 - අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පිළිබඳ සාරාංශය.....44-46

07 - අනුකූලතා වාර්තාව.....47-58

භාවිතා කළ කෙටි යෙදුම්

01. ස.ලේකම්	-	සහකාර ලේකම්
02. අ.හ.වි. නිලධාරි	-	අභ්‍යන්තර විගණන නිලධාරි
03. ස.වි. නිලධාරි	-	සහකාර විමර්ෂණ නිලධාරි
04. පරිපාලන නි.	-	පරිපාලන නිලධාරි
05. වැඩසටහන් ස.නි	-	වැඩසටහන් සහකාර නිලධාරි
06. භාෂා පරිව.	-	භාෂා පරිවර්තක
07. තො.ස.තා නිලධාරි	-	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි
08. ය.ලේ	-	යතුරු ලේඛක
09. ලඝු.ලේ	-	ලඝු ලේඛක
10. භාෂණ පරිව.	-	භාෂණ පරිවර්තක
11. රා.ක.ස	-	රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරි
12. පො.බැ	-	පොත් බැඳුම්කරු
13. කා.කා.ස.	-	කාර්යාල කාර්ය සහයක

අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය හා ව්‍යුහය

අපගැන

1.1 අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඈ ව්‍යවස්ථාව මගින් අධිකරණ සේවා කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත. අධිකරණයේ ස්වාධීනත්වය සුරැකීම, ස්වාධීන කොමිෂන් සභාවක් වශයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව පිහිටුවීමේ පරමාර්ථය වේ. ගරු අග්‍රවිනිශ්චයකාරතුමා නිල බලයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ඇ වගන්තියට අනුව අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරුන් දෙදෙනෙක් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයින් ලෙස පත් කරනු ලබයි. අධිකරණ සේවා කොමිෂන් සභාවට ලේකම්වරයකු කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන අතර, ඔහු හෝ ඇය මුල් අවස්ථා අධිකරණ විනිශ්චයකාරවරුන් අතරින් පත්කරනු ලබන්නේ ය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති වශයෙන් ගරු අග්‍රවිනිශ්චයකාර ජයන්ත ජයසූරිය මැතිතුමා 2019 වර්ෂයේ අප්‍රේල් මස 29 වන දින පත්වූ අතර, ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු බී.පී. අළුවිහාරේ මැතිතුමා සහ ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය මැතිතුමා කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයින් වශයෙන් කටයුතු කරයි. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වශයෙන් මහාධිකරණ විනිසුරු එච්.එස්.සෝමරත්න මහතා කටයුතු කරන අතර, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් වශයෙන් දිසා විනිසුරු පී.එම්.ටී.බණ්ඩාර මහතා (ශ්‍රී ලංකා අධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණිය), දිසා විනිසුරු ඩී.එම්.ඩී.සී.බණ්ඩාර මහතා (ශ්‍රී ලංකා අධිකරණ සේවයේ විශේෂ ශ්‍රේණිය) සහ ගරු අගවිනිසුරුතුමාගේ ලේකම් දිසා විනිසුරු ආනන්දි කනගරත්නම් මෙනෙවියද (ශ්‍රී ලංකා අධිකරණ සේවයේ I පන්තිය I ශ්‍රේණිය) කටයුතු කරනු ලබයි.

2022 වර්ෂයේදී අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සංයුතිය විධායක නිලධාරීන්, මාණ්ඩලික නිලධාරීන්, කළමනාකරණ සහකාර නිලධාරීන් සහ කණිෂ්ඨ කාර්ය මණ්ඩලයෙන් සමන්විත විය.

යුක්තිය පසිදලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහාත්, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව එය ඉෂ්ඨ සිද්ධ කිරීම සඳහාත්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරිපාලනයට යටත්ව දිවයින පුරා පිහිටුවා ඇති අධිකරණ පහත පරිදි දැක්විය හැක.

I.	ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණ	- 02
II.	වාණිජ මහාධිකරණ	- 01 (ශාලා 04කින් සමන්විත)
III.	පළාත්බද මහාධිකරණ	- 34
IV.	සිවිල් අභියාචනා මහාධිකරණ	- 22
V.	දිසා අධිකරණ	- 33
VI.	දිසා/මහේස්ත්‍රාත් අධිකරණ	- 52
VII.	මහේස්ත්‍රාත් අධිකරණ	- 54
VIII.	ළමා මහේස්ත්‍රාත් අධිකරණ	- 02
IX.	කම්කරු විනිශ්චය සභා	- 39

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා යටතේ ක්‍රියාත්මක වන කාර්ය මණ්ඩලය, අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත නීති මගින් පැවරී ඇති කාර්යන් සහ කර්තව්‍යයන් ඉටුකිරීමෙහිලා මනා දායකත්වයක් සපයනු ලබයි.

අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරමින් විධායකය හා ව්‍යවස්ථාදායකය අතර සංවරණ හා තුලනයක් පවත්වා ගනිමින් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමටත් ඒ සඳහා අවශ්‍ය වන යුක්තිය පසිදලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කොට වේගවත් කිරීමටත් අධිකරණ සේවා කොමිෂන් සභාව පියවර ගෙන තිබේ.

1.2 අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ මූලික කාර්යයන්


- මහාධිකරණ විනිසුරුවරුන්ගේ පත් කිරීම් හා විනය කටයුතු පිළිබඳව ජනාධිපතිතුමාට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- මහාධිකරණ විනිසුරුවරුන්ගේ පුහුණු කිරීම හා ස්ථාන මාරු කිරීම.
- මුල් අවස්ථා අධිකරණ විනිශ්චයකාරවරුන් වන දිසා විනිශ්චයකාරවරුන්, මහේස්ත්‍රාත්වරුන්, කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් හා විනය පාලනය.
- අධිකරණ වල කාර්යමණ්ඩලය ලෙස සේවය කරන උපලේඛනගත සේවයට අයත් රජයේ උපලේඛනගත නිලධාරීන් පත් කිරීම, ස්ථාන මාරු සිදුකිරීම, උසස් වීම් සහ ඔවුන්ගේ විනය සම්බන්ධ කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව සිදු කිරීම.
- ව්‍යවස්ථාව මගින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ලබා දී ඇති බලතලවලට යටත් වන අධිකරණවල පරිපාලනය හා අධීක්ෂණය.
- 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත ප්‍රකාරව සිය රැකියාව අතරතුරදී හදිසි අනතුරුවලට මුහුණපාන කම්කරුවන්ගේ (සේවකයන්ගේ) වන්දි ඉල්ලීම් පිළිබඳව කටයුතු කරන කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය සඳහා කොමසාරිස් සහ/හෝ නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් පත් කිරීම.
- මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත ප්‍රකාරව මුස්ලිම් ප්‍රජාවගේ පවුල් අධිකරණ බලය හොබවන ක්වාසිවරුන් පත්කිරීම, පුහුණු කිරීම හා විනය පාලනය.
- 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරි පනත ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා පොලිස් කොමිෂන් සභාවේ තීරණයන් පිළිබඳ අභියාචනා අධිකාරිය වන පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරියේ සභාපතිවරයා හා සාමාජිකයින් පත්කිරීම.
- 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත හා 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනත ප්‍රකාරව ගොවිජන සේවා සමාලෝචන මණ්ඩල පිහිටුවීම සඳහා පුද්ගලයින් 09 කට නොඅඩු ගණනකින් සමන්විත මණ්ඩලයක් පත් කිරීම. ගොවිජන සේවා සමාලෝචන මණ්ඩලය ගොවිජන විනිශ්චය සභාවේ තීරණයන් පිළිබඳ මුල් අභියාචනා අධිකාරියවේ.
- දිසා අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ සම්බන්ධවත්, සමස්ත අධිකරණ කාර්ය මණ්ඩලය සම්බන්ධවත් තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉදිරිපත් කර ඇති ඉල්ලීම් සම්බන්ධව 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතේ විධි විධාන ප්‍රකාරව තොරතුරු නිලධරයා සහ නම් කළ නිලධරයා ලෙස කටයුතු කිරීම.

- 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනත ප්‍රකාරව අභියාචනා විභාග කරනු ලබන ඉඩම් අත්පත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය සඳහා සභාපති ඇතුළුව සමාජිකයින් 16 දෙනෙකු පත් කිරීම සඳහා නිර්දේශ ලබා දීම.


- 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ පනත හා 2011 අංක 05 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත ප්‍රකාරව දරුවන් විසින් රැකබලා නොගන්නා දෙමව්පියන්ගේ නඩත්තු අයදුම්පත් තීරණය කරන වැඩිහිටි නඩත්තු මණ්ඩලයේ සභාපති සහ අනෙකුත් සාමාජිකයින් පත් කිරීම.

1.3 අධිකරණ සේවා කොමිෂන් සභාවේ ආයතනික ව්‍යුහය සහ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ ආයතනික ව්‍යුහය


අධිකරණ සේවා කොමිෂන් සභාවේ ආයතනික ව්‍යුහය



අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ ආයතනික ව්‍යූහය



අධිකරණ පද්ධතියේ ආයතනික ව්‍යූහය



ආයතනයේ ප්‍රගතිය හා ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග

2.1 2022 වර්ෂයේදී යුක්තිය පසිඳලීමේ කාර්යය පහසු කිරීම, කාර්යක්ෂම කිරීම, වේගවත් කිරීම සහ ශක්තිමත් කිරීමෙහි ලා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග හා එහි ප්‍රගතිය

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අධීක්ෂණයට යටත් අධිකරණ හා යුක්තිය පසිඳලීමේ ආයතනද ඒ හා සම්බන්ධ අනෙකුත් ආයතනද සමග මනා සම්බන්ධතාවයක් ගොඩ නඟා ගනිමින්, අධිකරණ සේවා කොමිෂන් සභාව යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට හා එය අප්‍රමාදව සිදු කිරීමට අවශ්‍ය කටයුතු හා ක්‍රියාමාර්ග ගෙන ඇත.

- 2022 වසර ආරම්භයේදී අධිකරණ සේවා කොමිෂන් සභාවේ ප්‍රමුඛ කාර්යයක් වූයේ COVID 19 සෞඛ්‍ය මාර්ගෝපදේශ ක්‍රමයෙන් ලිහිල් කිරීමත් සමග අධිකරණවල ක්‍රියාකාරිත්වය යථා තත්ත්වයට පත් කිරීම සහතික කිරීමයි.

  එය සාක්ෂාත් කර ගැනීම සඳහා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් අධිකරණ ක්ෂේත්‍රයේ සියලුම පාර්ශවකරුවන් වෙත අවස්ථානුකූලව චක්‍රලේඛ (උපදෙස්/මාර්ගෝපදේශ) නිකුත් කරන ලදී. එම චක්‍රලේඛ වල ක්‍රියාකාරිත්වය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී.

  යුක්තිය පසිඳලීම හා සම්බන්ධ අනෙකුත් පාර්ශවකරුවන් විසින් ද ඉහත සඳහන් කළ චක්‍රලේඛ /උපදෙස්/මාර්ගෝපදේශ පිළිපැදීම හේතුවෙන් අධිකරණවල ක්‍රියාකාරිත්වය යථා තත්ත්වයට පත් වීම බලාපොරොත්තු වූවාට වඩා වේගවත් විය.

  තවද COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් ගොඩ ගැසුනු නඩු කටයුතු කඩිනමින් අවසන් කිරීම සඳහාත් සහ ඒ අනුව ක්‍රමිකව අධිකරණ කටයුතු යථා තත්වයට පත් කිරීම සඳහාත් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් අවස්ථානුකූලව අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

- රටේ ආර්ථික තත්ත්වය කඩා වැටීම සහ උද්ගත වූ ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් ඇති වූ තත්ත්වයන් කළමනාකරණය කරමින් එදිනෙදා අධිකරණ කටයුතු අඛණ්ඩව පැවැත්වෙන බව සනාථ කිරීම සඳහා අවස්ථානුකූලව අවශ්‍ය උපදෙස් ලබා දීමට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියා කරන ලදී.

  එය සාක්ෂාත් කර ගැනීම සඳහා එම කාල සීමාව තුළ සීමිත මානව සම්පතින් (විශේෂයෙන්ම අධිකරණ කාර්ය මණ්ඩලයට අදාළව) උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා විශේෂ පරිපාලන හා කළමනාකරණ සැලැස්මක් ක්‍රියාවේ යොදවන ලදී.

- මීට අමතරව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් 2022 වර්ෂයේ ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 යන කාලපරාසය තුලදී කොමිෂන් සභා රැස්වීම් 39 ක ප්‍රමාණයක් පවත්වමින්, එම කොමිෂන් සභා රැස්වීම් වලදී සාමාන්‍ය වශයෙන් සලකා බලනු ලබන කාර්ය මණ්ඩල පත් කිරීම්, ස්ථාන මාරු කිරීම්, කාර්ය සාධන ඇගයීම් යනාදී සාමාන්‍ය පරිපාලනමය කාරණා වලට අතිරේකව පහතින් සඳහන් වූ විශේෂිත ක්‍රියාමාර්ග හා සබැඳි තීන්දු තීරණ ගන්නා ලදී.
    - අධිකරණ ශාලා 07 කින් සමන්විත වූ කොළඹ මහාධිකරණයේ අධිකරණ ශාලා සංඛ්‍යාව 01 කින් වැඩි කොට අංක 08 මහාධිකරණය පිහිටුවීම හා එසේ පිහිටුවා කොළඹ මහාධිකරණයේ සියලුම අභියාචනා නඩු, රිට් නඩු සහ ප්‍රතිශෝධන නඩු එම අධිකරණය වෙත යොමු කොට, අංක 01 සිට 07 දක්වා වූ අනෙකුත් මහාධිකරණ වලට විභාග නඩු (අධිචෝදනා සම්බන්ධයෙන් වූ නඩු) සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය දී කඩිනමින් අවසන් කිරීමට අවකාශය සලසන ලදී.
        - ↳ ඉහත පියවර අභියාචනා නඩු, රිට් නඩු සහ ප්‍රතිශෝධන නඩු මෙන්ම අනෙකුත් විභාග නඩු කටයුතු ද කාර්යක්ෂමව අවසන් කිරීමට මං පාදන ලදී.
    - වාණිජ නඩු කටයුතු කඩිනමින් විසඳා අවසන් කිරීමට පහසුකම් සැලසීම සඳහා වාණිජ මහාධිකරණයේ විවෘත අධිකරණ ශාලා සංඛ්‍යාව 01 කින් වැඩි කොට අංක 04 වාණිජ මහාධිකරණය පිහිටුවන ලදී. ප්‍රධාන වශයෙන් බේරුම්කරණය හා සැබැඳි නඩු කටයුතු සියල්ල අංක 04 වාණිජ මහාධිකරණයට යොමු කිරීම මගින් අංක 1, 2 හා 3 වාණිජ මහාධිකරණ වල අනෙකුත් වාණිජ නඩු (විභාග, විමසීම් ඇතුලුව) කඩිනමින් අවසන් කිරීමට අවකාශය සලසා දෙන ලදී.
        - ↳ ඉහත පියවර බේරුම්කරණ නඩු මෙන්ම අනෙකුත් වාණිජ නඩු කටයුතු ද කාර්යක්ෂමව අවසන් කිරීමට මං පාදන ලදී.
    - නව දිසා අධිකරණ 02ක් (මහර සහ වැලිසර දිසා අධිකරණ) සහ සංචාරක මහේස්ත්‍රාත් අධිකරණ 04ක් නව මහේස්ත්‍රාත් අධිකරණ (කහටගස්දිගිලිය, මැදවච්චිය, කලවංචිකුඩි සහ නොච්චියාගම මහේස්ත්‍රාත් අධිකරණ) ලෙස ස්ථාපිත කිරීම.
        - ↳ ඉහත පියවර මගින් එකී අධිකරණ බල ප්‍රදේශයන් තුළ නඩු කඩිනමින් විසඳීමට සහ නඩු කටයුතු ප්‍රමාදය හා තදබදය අවම කිරීමට මං පාදන ලදී.

- තවද අධිකරණ සේවා කොමිෂන් සභාව පහත සඳහන් ඒකාබද්ධ අධිකරණ වල සිවිල් සහ අපරාධ නඩු කටයුතු වෙන වෙනම ඇසීම සඳහා (පරිපාලන ව්‍යුහය ඒකාබද්ධ අධිකරණයක් තත්ත්වයේම තවදුරටත් පවත්වා ගනිමින්) ක්‍රියාමාර්ග ගන්නා ලදී. පරිපාලන ව්‍යුහය ඒකාබද්ධ ස්වරූපයේම තබා ගැනීමට සිදුවූයේ මහේස්ත්‍රාත් අධිකරණයක් හා දිසා අධිකරණයක් ලෙස වෙන් වෙන්ව පිහිටු වීමට අවශ්‍ය විනිසුරුවරුන්, කාර්ය මණ්ඩලය සහ යටිතල පහසුකම් නොමැති වීම හේතුවෙනි. (ඒකාබද්ධ අධිකරණ ලෙස පවත්වා ගෙන යන අධිකරණයක නඩු කටයුතු වෙන් වෙන්ව පැවැත්වීමට තීරණය කරනු ලබන්නේ තවදුරටත් ඒකාබද්ධ අධිකරණයක් ලෙස පවත්වාගෙනයාමෙන් ඵලදායි ලෙස නඩු කටයුතු අවසන් කිරීමට නොහැකි බවට පෙනී යන අවස්ථාවන් වලදී වේ)
    - කිලිනොච්චිය දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
    - වලස්මුල්ල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
    - තංගල්ල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
    - රුවන්වැල්ල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
    - ගම්පොල දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
    - බලංගොඩ දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
    - වරකාපොළ දිසා/මහේස්ත්‍රාත් අධිකරණය
    - මිනුවන්ගොඩ දිසා/ මහේස්ත්‍රාත් අධිකරණය

    ↳ ඉහත පරිදි සිවිල් නඩු කටයුතු සහ අපරාධ නඩු කටයුතු වෙන වෙනම ඇසීම සඳහා පියවර ගැනීම මගින් එකී අධිකරණ බල ප්‍රදේශයන් තුළ සිවිල් නඩු කටයුතු මෙන්ම අපරාධ නඩු කටයුතු කඩිනමින් විසඳීමට මං පාදන ලදී. එය නඩු කටයුතු ප්‍රමාදය හා තදබදය අවම කිරීමට මහෝපකාරී විය.

- නඩු කටයුතු අධික අධිකරණ හඳුනා ගෙන අලුතින් බඳවා ගත් විනිශ්චයකාරවරුන් "*අතිරික්ත අතිරේක*" පදනම මත එම අධිකරණ වලට අනුයුක්ත කර ඉතා පැරණි නඩු කටයුතු විසඳීමට ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කරන ලදී.
    - අලුතින් බඳවා ගත් අධිකරණ නිලධාරියෙකු කෑගල්ල "*අතිරික්ත අතිරේක*" මහේස්ත්‍රාත් ලෙස අනුයුක්ත කිරීම.

- අලුතින් බඳවා ගත් අධිකරණ නිලධාරියෙකු වවුනියා "*අතිරික්ත අතිරේක*" මහේස්ත්‍රාත් ලෙස අනුයුක්ත කිරීම.
- අලුතින් බඳවා ගත් අධිකරණ නිලධාරියෙකු වැල්ලවාය "*අතිරික්ත අතිරේක*" මහේස්ත්‍රාත් ලෙස අනුයුක්ත කිරීම.

↳ ඉහත පරිදි කටයුතු කිරීම නඩු කටයුතු බහුල එවැනි අධිකරණ බල කලාප තුළ වූ පැරණි නඩු හදුනාගෙන එම නඩු කඩිනමින් විසඳීමට මං පාදන ලදී.

➢ අධිකරණ භූමි තුළ නිශ්කාෂණය නොකරන ලද නඩු භාණ්ඩ ගොඩගැසුණු අධිකරණ හදුනා ගෙන එම අධිකරණ වල නඩු භාණඩ කඩිනමින් නිශ්කාෂණය කිරීම සඳහා ද අලුතින් බඳවා ගත් විනිශ්චයකාරවරුන් "*අතිරික්ත අතිරේක*" පදනම මත එම අධිකරණ වලට අනුයුක්ත කිරීමට පියවර ගන්නා ලදී.

- නඩු භාණ්ඩ නිශ්කාෂණය කිරීමට ප්‍රමුඛත්වය ලබා දෙමින් අලුතින් බඳවා ගත් අධිකරණ නිලධාරියෙකු මීගමුව "*අතිරික්ත අතිරේක*" මහේස්ත්‍රාත් ලෙස අනුයුක්ත කිරීම.
- නඩු භාණ්ඩ නිශ්කාෂණය කිරීමට ප්‍රමුඛත්වය ලබා දෙමින් අලුතින් බඳවා ගත් අධිකරණ නිලධාරියෙකු කුලියාපිටිය "*අතිරික්ත අතිරේක*" මහේස්ත්‍රාත් ලෙස අනුයුක්ත කිරීම.
- නඩු භාණ්ඩ නිශ්කාෂණය කිරීමට ප්‍රමුඛත්වය ලබා දෙමින් අලුතින් බඳවා ගත් අධිකරණ නිලධාරියෙකු මහනුවර "*අතිරික්ත අතිරේක*" මහේස්ත්‍රාත් ලෙස අනුයුක්ත කිරීම.

↳ ඉහත ක්‍රියාමාර්ගය එම අධිකරණ වල නඩු භාණ්ඩ නිශ්කාෂණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරුන් හට පැවරී තිබූ වගකීම ලිහිල් කිරීමටත් සහ ගොඩගැසී තිබූ නඩු භාණ්ඩ නිශ්කාෂණය කිරීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීමටත් මං පාදන ලදී.

➢ COVID 19 වසංගත තත්ත්වය, රටේ ආර්ථික තත්ත්වය කඩා වැටීම සහ උද්ගත වූ ප්‍රවාහන දුෂ්කරතා මඟ හැරී එයින් ඇති වූ බාධාවන් ඉවත් වී අධිකරණ කටයුතු පෙර පරදි භෞතිකව පැවැත්වීම යථා තත්ත්වයට පත් වන තෙක් අධිකරණ සේවා කොමිෂන් සභාවේ විෂය පථය තුල ගත හැකි තීන්දු තීරණ ගනිමින් නව තාක්ෂණය යොදා ගනිමින් මාර්ගගත ක්‍රමයට බන්ධනාගාර රැඳවියන්ගේ රක්ෂණ දීර්ඝ කිරීම සිදු කිරීම (Extending remand of the prison inmates remotely) සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

↳ ඉහත ක්‍රියාමාර්ගය අධිකරණයේ කාලය විශාල වශයෙන් ඉතුරු කරමින් බන්ධනාගාර රැඳවියන්ගේ රක්ෂණ දීර්ඝ කිරීමට මං පාදන ලදී.

- නව තාක්ෂණය භාවිතා කිරීමට පහසුකම් සැලසීම;

  කොළඹ මහාධිකරණ අංක 04 සහ අංක 06 අධිකරණයන් හි ඇප සම්බන්ධ කටයුතු ඉලෙක්ට්‍රොනික (e-bail) මාර්ගයෙන් කරගෙන යාම වඩාත් විධිමත්ව හා ශක්තිමත්ව කිරීමට පියවර ගන්නා ලදී.

  ↳ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ගනු ලැබූ ඉහත පියවර බන්ධනාගාර තදබදය අවම කිරීමටත් ඇප සම්බන්ධ කටයුතු කඩිනම් කිරීමටත් මං පාදන ලදී.

- COVID 19 වසංගත තත්ත්වයද රටේ ආර්ථික තත්ත්වය කඩා වැටීමද සහ ඒ අනුසාරයෙන් උද්ගත වූ ප්‍රවාහන දුෂ්කරතා ද ආදී විවිධ බාධක හමුවේ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් භෞතිකව හා දුරස්ථ මාර්ගයෙන් (Physically and Remotely) අඛණ්ඩවම කොමිෂන් සභා රැස්වීම් පවත්වමින් නිසි තීන්දු තීරණ කලට වේලාවට ගැනීම හේතුවෙන් දිවයින පුරා පිහිටි අධිකරණ වල අධිකරණ කටයුතු සාමාන්‍ය පරිදි කිසිදු බාධාවකින් තොරව පවත්වා ගැනීම සහතික වන ලදී.


  COVID 19 වසංගත තත්ත්වය, රටේ ආර්ථික තත්ත්වය කඩා වැටීම සහ ඒ අනුසාරයෙන් උද්ගත වූ ප්‍රවාහන දුෂ්කරතා හේතුවෙන් ඇති වූ තත්ත්වයන් හමුවේ, යුක්තිය පසිදලීමේ ක්‍රියාවලියේ නිරත අනෙකුත් පාර්ශවකරුවන්ට මුහුණ දීමට සිදුවූ දුෂ්කරතාවයන් අවම කිරීමට අවශ්‍ය අවස්ථා වලදී ඔවුන්ට අවශ්‍ය උපදෙස්/මාර්ගෝපදේශ ලබා දීමට අධිකරණ සේවා කොමිෂන් සභාව සක්‍රීයව මැදිහත්වීම් සිදු කරන ලදී.

- 2022 වර්ෂය තුළ අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත සෘජුව සහ වෙනත් ආයතන සහ දෙපාර්තමේන්තු හරහා යොමු කරන ලද මහජන පෙත්සම් 800 කට අධික ප්‍රමාණයක් සඳහා විසඳුම් ලබා දීමට අවශ්‍ය තීන්දු තීරණ ගැනීමට මෙම කාල සීමාව තුළ අධිකරණ සේවා කොමිෂන් සභාව ක්‍රියා මාර්ග ගෙන ඇත. (ස්වකීය සාමාන්‍ය පරිපාලන කටයුතුවලට අතිරේකව)

- තවද ඉහත සඳහන් කාලසීමාව තුළ තොරතුරු දැනගැනීමේ පනත යටතේ යොමු වී ඇති ඉල්ලීම් 48 ක් සඳහාත් එපරිද්දෙන් ප්‍රතිචාර හා විසඳුම් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇත.

- 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ දිවයිනේ පිහිටි සමස්ථ දිසා හා මහේස්ත්‍රාත් අධිකරණ වල නඩු පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත පහත පරිදි වේ,

2021 හා 2022 වර්ෂයන්ට අදාලව
නඩු කටයුතු සම්බන්ධ තොරතුරු



	සිවිල් නඩු සංඛ්‍යාව	අපරාධ නඩු සංඛ්‍යාව	විභාග නඩු සංඛ්‍යාව	කැදවීම් නඩු සංඛ්‍යාව	මුළු නඩු සංඛ්‍යාව
2021 වර්ෂය	271,950	778,450	157,072	893,328	1,050,400
2022 වර්ෂය	264,162	762,244	181,972	844,434	1,026,406

- විභාග/විමසීම් නඩු කඩිනමින් අවසන් කිරීමේ පරමාර්ථයෙන් විනිශ්චයකාරවරුන්ගේ වැටුප් වර්ධක වර්ෂයකට අදාලව ප්‍රකාශයට පත් කලයුතු අවම හබකල තීන්දු/නියෝග සංඛ්‍යාවන් නියම කරමින් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් චක්‍රලේඛ නිකුත් කර ඇති අතර **COVID 19** වසංගත තත්ත්වය හමුවේ ද එම චක්‍රලේඛ යම් යම් සීමා කිරීම් වලට යටත්ව අදාළ කර ගනිමින් ඒ අනුසාරයෙන් එවැනි බාධක පැවතියදීත් විනිශ්චයකාරවරුන්ගේ කාර්යසාධනය අවම මට්ටමක හෝ පවත්වා ගෙන යනු පිණිස ක්‍රියාමාර්ග ගන්නා ලදී.

  ඉහත පරිදි **COVID 19** වසංගත තත්ත්වය හමුවේ යම් යම් සීමා කිරීම් වලට යටත්ව ක්‍රියාත්මක කරන ලද විනිශ්චයකාරවරුන්ගේ කාර්යසාධන ඇගයීම්, **COVID 19** වසංගත තත්ත්වය ක්‍රමයෙන් පහව යාමත් සමග එම තත්ත්වයට පෙර පැවති කාර්ය සාධන මට්ටම් වලින්ම නැවත පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රමික යාන්ත්‍රණයක් සකසා ක්‍රියාවේ යොදවන ලදී.

- නඩු කටයුතු වල ප්‍රමාදයන් වැලැක්වීම සඳහා නඩු අධික තර අධිකරණ සඳහා හැකිතාක් දුරට පළපුරුදු විනිශ්චයකාරවරුන් පත්කිරීම.

- විනිශ්චයකාරවරුන්ගේ දැනුම සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමටත්, ආකල්ප වර්ධනය කිරීම සඳහාත් පිහිටුවා ඇති "විනිශ්චයකාරවරුන්ගේ ආයතනය" මගින් සංවිධානය කරනු ලබන පුහුණු කිරීම්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ ආදිය සඳහා සුදුසු විනිසුරුවරුන් තේරීම හා නම් කිරීම.
- අනිකුත් ආයතන/සංවිධාන මගින් සංවිධානය කරනු ලබන සමුළු, වැඩමුළු සහ සම්මන්ත්‍රණ ආදිය සඳහා සුදුසු විනිසුරුවරුන් තේරීම හා නම් කිරීම.
- අධිකරණ සේවා කොමිෂන් සභාව **USAID** ආයතනය සමග එක්ව නව තාක්ෂණය භාවිතා කරමින් නඩු කටයුතු ප්‍රමාදය අවම කිරීමට සහ අධිකරණයේ නඩු නිසි පරිදි කළමනාකරණය කිරීම සඳහා තෝරා ගත් අධිකරණ කිහිපයක දියත් කරන ලද ආදර්ශ අධිකරණ ව්‍යාපෘතිය (**Model Courts Project**) 2020 හා 2021 වර්ෂයන් තුළ දී අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට අපොහොසත් වන ලදී. එසේ අපොහොසත් වූයේ අනපේක්ෂිත අයුරින් බල පැවැත්වුනු **COVID** 19 වසංගතය, ආර්ථික අර්බුදය ආදී හේතූන් නිසා වේ. කෙසේ වෙතත් එසේ පසුබෑමකට ලක්වූ එම වැඩ පිළිවෙල කඩිනම් කර විවිධ බාධක හමුවේ අඛණ්ඩව පවත්වාගෙන යාමට **USAID** ආයතනය සමග එක්ව අධිකරණ සේවා කොමිෂන් සභාව 2022 වර්ෂයේ දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- ඒ අනුව **2022** වසර අවසානයේදී පහත සඳහන් අධිකරණයන් සඳහා ආදර්ශ අධිකරණ ව්‍යාපෘතිය (**Model Courts Project**) දියත් කිරීමට හැකිවිය;

  (i). කොළඹ වාණිජ මහාධිකරණය

  (ii). කොළඹ අංක **04** මහාධිකරණය

  (iii). නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණය

  (iv). නුගේගොඩ අතිරේක මහේස්ත්‍රාත් අධිකරණය

  (v). නුගේගොඩ දිසා අධිකරණය

  (vi). කොළඹ අංක **01** කම්කරු විනිශ්චයාධිකාරය

  (vii). කොළඹ අංක **13** කම්කරු විනිශ්චයාධිකාරය

- **USAID** ආයතනයේ සහාය ඇතිව අධිකරණ කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ කුසලතා සහ පාරිභෝගික සේවා පුහුණු වැඩමුළු ආරම්භ කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව පියවර ගැනීම.

- විනිශ්චයකාරවරුන්ගෙන් හා කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්ගෙන් නිසි සේවයක් ලබා ගැනීම අරමුණු කරගනිමින් ඔවුන් තෘප්තිමත් කිරීම පිණිස පහත ක්‍රියාමාර්ග ගන්නා ලදී;

  (i). පාරදෘෂ්‍ය උසස්වීමේ කාර්ය පටිපාටියක් පවත්වාගෙන යාම,

  (ii). පාරදෘෂ්‍ය ස්ථාන මාරු ලබා දීමේ කාර්ය පටිපාටියක් පවත්වාගෙන යාම,

(iii). කාර්ය සාධනය මැනීමේ කාර්ය පටිපාටිය පාරදෘෂ්‍ය ලෙස පවත්වාගෙන යාම.

- අධිකරණ නිලධාරීන්ට සහ අධිකරණ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ කාර්යයන් නිසි ලෙස ඉටු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් (අධිකරණ ගොඩනැගිලි, නිල නිවාස, කාර්යාල උපකරණ, නිල රථ යනාදිය) ලබා දීමට ද අවශ්‍ය අවස්ථා වලදී අධිකරණ සේවා කොමිෂන් සභාව මැදිහත් වීම සිදු කරන ලදී.

- අධිකරණ භූමි තුළ ගොඩගැසී ඇති නඩු භාණ්ඩ අධිකරණ සේවා කොමිෂන් සභා වක්‍රලේඛ අංක 422 අනුව, නව තාක්ෂණය භාවිතා කරමින් කඩිනමින් නිශ්කාෂණය කිරීමට කටයුතු සිදු කරන්නේද යන්න පිළිබඳව පසුවිපරම් සිදුකිරීම. විශේෂයෙන් මහේස්ත්‍රාත් අධිකරණ මගින් නඩු භාණ්ඩ බැහැර කිරීම සඳහා අවම වශයෙන් වසරක් තුළ වෙන්දේසි 5ක් පැවැත්වීමට ක්‍රියා කිරීම පිළිබඳව පසු විපරම් කිරීම.

- එක් එක් සේවාවන්ට අදාල කාර්යක්ෂමතා කඩඉම් ආදී සියළු විභාග නියමිත කාල සීමාවන් තුළදී පැවැත්වීමට අවශ්‍ය පියවර ගැනීම.
  ඒ අනුව, **2022** වර්ෂයේ දී පහත එක් එක් සේවාවන්ට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා ඇත;
  - **i)** අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණිය,
  - **ii)** අධිකරණ භාෂණ පරිවර්තක,
  - **iii)** අධිකරණ ලිපිකරු,
  - **iv)** අධිකරණ ලඝු ලේඛක,
  - **v)** අධිකරණ යතුරු ලේඛක,
  - **vi)** අධිකරණ පොත් බැඳුම්කරු.

- අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ පවතින සීමිත මානව සම්පත් හා අවම යටිතල පහසුකම් උපයෝගී කරගනිමින් විනිශ්චයකාරවරුන්ට හා උපලේඛනගත රජයේ නිලධරයන්ට එරෙහිව ලැබෙන පැමිණිලි පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාව දැඩි අවධානයෙන් ක්‍රියා කරන අතර, ඒ සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඈ දරන ව්‍යවස්ථාව ප්‍රකාරව විමර්ශන පැවැත්වීම සහ ඉන් හෙළිවන කරුණු අනුව විනය පරීක්ෂණ පැවැත්වීම ආදී විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා විධිමත්ව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කරනු ලබයි.

- 2022 වර්ෂයේ ඉහත පරිදි වූ බාධක හමුවේ වුවද අධිකරණ නිලධාරීන්ට සහ අධිකරණ කාර්ය මණ්ඩලයට එරෙහිව පහත විමර්ශන සහ පරීක්ෂණ සිදු කර ඇත.

  - විධිමත් විනය පරීක්ෂණ 04 ක කටයුතු ආරම්භ කර අවසන් කර ඇත
  - මූලික විමර්ෂණ කටයුතු 07 ක් පවත්වා අවසන් කර ඇත
  - තවද එම කාල සීමාව තුලදී නව මූලික විමර්ෂණ 15ක් සහ නව විධිමත් විනය පරීක්ෂණ 05ක් ආරම්භ කිරීම සම්බන්ධයෙන්වූ නියෝග ලබා ගෙනද ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ පැරණි ගොඩනැගිල්ල කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2017 වර්ෂයේ සිට මේ දක්වාම අදාළ බලධාරීන් යුහුසුළුව ක්‍රියා නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය ක්‍රියාත්මක වනු ලබන්නේ ඉඩකඩ ඉතාමත් සීමිත වූ පෙර නිමි බහාලුම් පෙට්ටි වලින් සකසන ලද තාවකාලික පරිශ්‍රයක වේ. ඒ අනුව අධිකරණ සේවා කොමිෂන් සභාව ස්වකීය ව්‍යවස්ථාපිත වගකීම් ඉටු කරනු ලබන්නේ බලවත් දුෂ්කරතා මධ්‍යයේ වේ.

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාව 117ක් වන අතර 2022.12.31 දිනට අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ තථ්‍ය සේවක සංඛ්‍යාව 63කි. මෙම ලේකම් කාර්යාලයේ විවිධ තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව 54 ක් වන අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් 46% ක ප්‍රතිශතයක් ගනී. ලේකම් කාර්යාලයේ පවතින පුරප්පාඩු පිරවීමට නොහැකි එක් ප්‍රධාන හේතුවක් වන්නේ මතු සඳහන් කරන ලද සීමිත ඉඩකඩ සම්බන්ධ ගැටළුව වේ.

මීට අමතරව දැනට උපලේඛනගත රාජ්‍ය නිලධාරීන්ගේ සේවයේ (අධිකරණ කාර්ය මණ්ඩලය) පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් (1000කට ආසන්න ප්‍රමාණයක්) පවතී. තවද, නව බඳවා ගැනීම් කල් දැමීමට මහා භාණ්ඩාගාරය ගත් තීරණය හේතුවෙන් සීමිත වූ මානව සම්පතක් යොදා ගනිමින් දිවයින පුරා පිහිටි අධිකරණ නිසි පරිදි පවත්වාගෙන යාම අතිශය අභියෝගාත්මක කාර්යයක් බවට පත්විය. මානව සම්පත් හිඟය යම් මට්ටමකින් හෝ සපුරා ගැනීමට සහාය ලබා ගැනීමට අදාළ බලධාරීන් වෙතින් කොතෙකුත් ඉල්ලීම් සිදු කළද 2022 වසර තුළ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අධිකරණ සේවා කොමිෂන් සභාවට නොලැබුණි.

ඉහතින් සඳහන් කරන ලද **COVID** 19 වසංගතය**,** රටේ ආර්ථික තත්ත්වය කඩා වැටීම සහ ඒ අනුසාරයෙන් උද්ගත වූ ප්‍රවාහන දුෂ්කරතා පැන නැගීම හේතුවෙන් සාමාන්‍ය පරිදි අධිකරණ කටයුතු පවත්වා ගැනීමට නොහැකි වීම ආදී නොයෙකුත් බාධක මධ්‍යයේ වුවද අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය පසුගිය වසර තුළ බොහෝ ජයග්‍රහණ අත් පත් කර ගෙන ඇත.

2.2 ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග

- අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරිපාලනයට යටත් සියලු අධිකරණ හා ආයතන වල යුක්තිය පසිදලීමේ කර්තව්‍ය අධික්ෂණය කිරීම සඳහාත් ඒවායේ පරිපාලනය නිසි පරිදි පවත්වාගෙන යාම සඳහාත් 2021 වර්ෂයේ දී උපයෝගී කර ගත් මෙවලම් තවදුරටත් කාර්යක්ෂම හා ඵලදායි ලෙස යොදා ගැනීම.

- විසඳීම පමාවී, කල්ගත වී ඇති නඩු සහිත අධිකරණ හඳුනා ගැනීමට පියවර ගෙන එම අධිකරණ වල පවතින එවැනි නඩු විසඳීමට අවශ්‍ය විශේෂිත ක්‍රියා මාර්ග ගැනීම.

- අධිකරණ වල පවතින ඉතා පැරණි නඩු හඳුනාගෙන එම නඩු කඩිනමින් විසඳීම සඳහා ප්‍රමුඛත්වය ලබාදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

- නඩු කටයුතු කඩිනමින් අවසන් කිරීම සඳහා ඒවා දිනපතා විභාගයට ගැනීම හැකිතාක් දුරට ප්‍රවර්ධනය කිරීම.

- කම්කරු විනිශ්චය සභා වල කටයුතු කරන කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්ගේ කාර්ය සාධනය ඇගයීමට නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

- අධිකරණ කාර්යාල වල කටයුතු බාධාවකින් තොරව ඉෂ්ඨ සිද්ධ වන බව සනාථ කරනු වස් උපලේඛනගත සේවයේ පවතින පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

- අධිකරණයන්හි සේවය කරන උපලේඛනගත සේවයට අයත් රජයේ නිලධරයන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම සඳහා දැනට පවත්වාගෙන යනු ලබන පුහුණු වැඩ සටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම සහ අමතර පුහුණු වැඩසටහන් සකසා ආරම්භ කිරීම.

- අලුතින් ස්ථාපිත කිරීමට සැලසුම් කර එසේ ස්ථාපිත කරනු ලබන අධිකරණ වල යටිතල පහසුකම් සැපයූ වහාම ඒ සඳහා අවශ්‍ය විනිසුරුවරුන් සහ කාර්ය මණ්ඩලය පත්කර නඩු කටයුතු ආරම්භ කිරීම.

- **USAID** ආයතනය සමග එක්ව ක්‍රියාවේ යොදවන ආදර්ශ අධිකරණ ව්‍යාපෘතිය (Model Court Project) තවදුරටත් පුළුල් කරමින් එය ක්‍රියාත්මක වන අධිකරණ සංඛ්‍යාව වැඩි කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

- අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සතු සම්පත් ප්‍රවර්ධනය කිරීම.

2022 වර්ෂය සඳහා මූල්‍ය සමාලෝචන වාර්තාව

එසිජ්-එප්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	කළඹ 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිජ්-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්			-	
-	භාණ්ඩාගාර අග්‍රිම		81,055,000	74,510,000.00	එසිජ්-3
-	තැන්පතු		151,510	148,091.00	එසිජ්-4
-	අත්තිකාරම් ගිණුම්		2,682,235	1,949,917.00	එසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		83,888,745	76,608,008.00	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		83,888,745	76,608,008	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		219,868	212,637.00	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		83,668,877	76,395,371	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
73,620,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	64,040,398	59,396,528.00	
25,462,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	22,370,479	16,666,441.00	එසිජ්-2(ii)
360,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	270,461	230,225.00	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
99,442,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		86,681,338	76,293,194	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
-	වැඩිදියුණු කිරීම්	10	-	19,052,934.00	
900,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	348,630	937,587.00	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එසිජ්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
200,000	හැකියා වර්ධනය	14	-	-	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
1,100,000	මුළු මූලධන වියදම් (උ)		348,630	19,990,521	
	තැන්පතු ගෙවීම්		95,224	130,192.00	එසිජ්-4
	අත්තිකාරම් ගෙවීම්		2,856,541	4,056,788.00	එසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		2,951,765	4,186,980	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		89,981,733	100,470,695	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(6,312,856)	(24,075,324)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(6,312,856)	(24,075,324)	එසිජ්-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	එසිජ්-3
			(6,312,856)	(24,075,324)	

ඒසිඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	433,594,509	63,875,494
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	8,250,141	8,075,835
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		441,844,650	71,951,329
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		8,155,041	8,037,021
දේපළ පිරියත හා උපකරණ සංචිතය		433,594,509	63,875,494
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	-	
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	95,100	38,814
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		441,844,650	71,951,329

පිටු අංක ....1..... සිට ....28.... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ....29.... සිට ....36.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචනා සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමිසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	එච්.එම්. එරංගා ලක්මාලි
දිනය : 27/02/2023	දිනය : 27/02/2023	දිනය : 2023/02/24
එච්. සංජීව සෝමරත්න ලේකම් අධිකරණ සේවා කොමිෂන් සභාව කොළඹ 12	එච්. සංජීව සෝමරත්න ලේකම් අධිකරණ සේවා කොමිෂන් සභාව කොළඹ 12	අධිකරණ සේවා කොමිෂන් සභාව කොළඹ 12.

එස්ජ්-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	6,793,640	4,675,110
අග්‍රිම ලැබීම්	81,055,000	74,510,000
අත්තිකාරම් අයකර ගැනීම්	2,121,051	2,270,317
තැන්පතු ලැබීම්	151,510	148,091
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	90,121,201	81,603,518
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	86,330,477	76,036,089
සහනාධාර සහ මාරුකිරීම්	270,461	230,225
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	219,868	212,637
අත්තිකාරම් ගෙවීම්	2,856,541	4,056,788
තැන්පතු ගෙවීම්	95,224	130,192
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	89,772,571	80,665,931
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	348,630	937,587
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
ගිම්හාන් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	348,630	937,587
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	348,630	937,587
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(348,630)	(937,587)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* නම් වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් කාර්ය සාධනය

රු. ,000

ආදායම් සංකේතය	ආදායම් විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		ආදායම් රැස්කිරීම	
		මූලික ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	මුදල (රු.)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස
අදාල නොවේ.					

3.6 ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	ප්‍රතිපාදන		තථ්‍ය වියදම්	අවසාන වෙන් කිරීමේ ප්‍රතිශතයක් ලෙස ප්‍රතිපාදන භාවිතය
	මූලික	අවසන්		
පුනරාවර්ථන	99,442	99,442	86,681	87.17%
ප්‍රාග්ධන	1,100	1,100	348.630	31.69%

3.7 මු.රෙ.208 අනුව, මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාව අනෙකුත් අමාත්‍යාංශවල නියෝජිතයෙකු ලෙස/ දෙපාර්තමේන්තුවලට වියදම් සඳහා ප්‍රතිපාදන ප්‍රදානය කිරීම.

රු. ,000

අනුක්‍රමික අංකය	කුමන අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ප්‍රතිපාදන	වෙන් කිරීමේ අරමුණ	ප්‍රතිපාදන		තථ්‍ය වියදම්	අවසාන වෙන් කිරීමේ ප්‍රතිශතයක් ලෙස ප්‍රතිපාදන භාවිතය
			මූලික	අවසන්		
	නැත					

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	2022.12.31 දිනට සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය	2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාවට අනුව ශේෂය	තවදුරටත් ගිණුම් ගත කිරීමට ඇති ශේෂය	ප්‍රතිශතයක් ලෙස වාර්තා කිරීමේ ප්‍රගතිය
9151	ගොඩනැගිලි සහ ව්‍යුහයන්	**2,612.225**	**2,612.225**		
9152	යන්ත්‍රෝපකරණ සහ උපකරණ	**23,571.955**	**23,571.955**		
9153	ඉඩම්	**379,000.00**	**379,000.000**		
9154	අස්පෘශ්‍ය වත්කම්		-		
9155	ජීව වත්කම්		-		
9160	වැඩකිරීමේ ප්‍රගතිය		-		
9180	බදු වත්කම්		-		

* ඉඩමේ වටිනාකම තක්සේරු කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

***** විගණකාධිපතිවරයා විසින් යොමු කරන ලද 2023.05.31 දිනැති විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සඳහා 29 පිටුව වෙත යොමු වන්න.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. JLO/B/JSC/FA/2022/04 මෙබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 31 දින

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව

ශීර්ෂය 007 - අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 007 - අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම්

වර්ෂය තුළ අපහරණය කරන ලද වාහන හා අනෙකුත් වත්කම් විකිණීමෙන් ලත් ආදායම් වූ රු.3,603,750 ක් වූ වටිනාකම මුදල් ප්‍රවාහයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ හිමිකම් ඉවත් කිරීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම යටතේ දැක්විය යුතු වුව ද, එය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි.

1.6.2 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.5 ඡේදය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ශේෂය, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂයේ සහ වසර අවසානයේ අග්‍රිම ශේෂයේ එකතුවට සමාන විය යුතු වුවත්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දෙසැම්බර් 31 දිනට රු.219,868 ක් වූ අග්‍රිම ශේෂය දක්වා නොතිබුණි.

1.6.3 අග්‍රිම ශේෂය

2022 දෙසැම්බර් 31 දිනට ඒසීඒ - 3 හි භාණ්ඩාගාර පොත් අනුව අග්‍රිම ශේෂය රු.219,868 ක් ලෙස දක්වා තිබුණ ද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එය මාර්ගස්ථ මුදල් ලෙස මූල්‍ය වත්කම් යටතේ ද, අග්‍රිම ශේෂය ලෙස ජංගම වගකීම් යටතේ ද දක්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) ප්‍රාග්ධන වැය විෂයයන් 02 කට අදාළව රු.600,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සඳහා ප්‍රතිපාදිත රු.5,950,000 කින් රු.1,912,363 ක් ඉතිරි වී තිබූ අතර, එම ඉතිරිවීම් සියයට 25 සිට 95 දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ඇ) 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 අංක දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (vii) ඡේදය ප්‍රකාරව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරි වීම් ඇත්නම් ඒවා වර්ෂය අවසන් වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු වුවත්, පුනරාවර්තන වැය විෂයයන් 02 ක රු.4,350,000 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2023 වර්ෂයේ දී ගෙවන ලද 2022 වර්ෂයට අදාළ රු. 210,790 ක් වටිනා බැරකම්, බැරකම් ලේඛනයේ සහ 2022 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළයුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථානයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.1.2 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි	
i. 103 (1) (ඉ)	2021 දෙසැම්බර් 09 දින මෝටර් රථයක් හානියකට පත් වීම පිළිබඳව හානිපාඩු ලේඛනය තුළ ඇතුළත්කර නොතිබුණු අතර, 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරනු ලබන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ අයකර ගැනීම් සහ පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශනයේ ද ඇතුළත් කර නොතිබුණි.
ii. 104 (1) (අ)	මෝටර් රථයකට සිදු වූ හානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි.
iii. 891	මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
iv. 1646	මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන 05 ක් සම්බන්ධයෙන් ධාවන සටහන් හා මාසික සාරාංශයේ මුල් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ආ)2016 දෙසැම්බර් 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 3.1 ඡේදය	චක්‍රලේඛය ප්‍රකාරව වාහන 05 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

2.5 තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ හා සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව කිසියම් විශේෂිත කාර්යයන් සඳහා මණ්ඩලික නිලධාරීන්ට ලබාදෙන අතුරු අග්‍රිම දින 10 ක් ඇතුළත නැවත පියවිය යුතු වුවත්, එක් අවස්ථාක දී ලබාදුන් රු.100,000 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන චක්‍රලේඛයේ 12.1 ඡේදය සහ 2022 මැයි 26 දිනැති PFD/RED/REG/02/CC/2022 මුදල් අමාත්‍යාංශ ලිපිය ප්‍රකාරව 2021 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2022 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාර වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

3.2 කළමනාකරණ දුර්වලතා

වසර 05 ට වැඩි කාලයක සිට පැවත එන සේවය හැර ගිය නිලධාරියෙකුගෙන් රු.185,000 ක ණයශේෂයක් අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වෙනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

4 තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන වැඩසටහන

2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩීඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය සඳහා තිරසර සංවර්ධන අරමුණු හා දර්ශක හඳුනාගෙන එම තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි.

73

4.2 පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම

2008 පෙබරවාරි 06 දිනැති සහ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 සහ 05/2008 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය අංශයේ ක්‍රියාකාරකම් වඩාත් කාර්යක්ෂම කිරීමට සහ ඒ සඳහා සම්බන්ධවන්නා වූ පාර්ශවයන් අතර මනා අවබෝධයක් සහ එකිනෙකා අතර විශ්වාසය වැඩි දියුණු කිරීමට පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම සිදුකළ යුතුව තිබුණ ද, දෙපාර්තමේන්තුවේ මේ දක්වා පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම සිදුකර නොතිබුණි.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 40 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. අධිකරණ අමාත්‍යාංශය විසින් 2022 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර තිබුණ ද, අභ්‍යන්තර විගණන අංශය මගින් අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස්කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සේවා කාණ්ඩය	අනුමත සංඛ්‍යාව	තථ්‍ය සංඛ්‍යාව	(පුරප්පාඩු) / අතිරික්තය
ජ්‍යෙෂ්ඨ මට්ටම	15	06	(9)
තෘතීය මට්ටම	04	01	(3)
ද්විතීය මට්ටම	73	42	(31)
ප්‍රාථමික මට්ටම	25	10	(15)
එකතුව	117	59	(58)

: සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවෙහි අනුමත කාර්ය මණ්ඩලය 117 ක් වුව ද, දෙසැම්බර් 31 දින වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 ක්, තෘතීයික මට්ටමේ තනතුරු 03 ක් ද, ද්විතීය මට්ටමේ තනතුරු 31 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 15 ක ඌණතාවයක් පැවතුණි.

ආර්.එස්. කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

කාර්යසාධන දර්ශක

4.1 2022 වර්ෂයේ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම

අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තථ්‍ය නිමැවුම			
		100% - 90%	89% - 75%	74% - 50%	49% - 0%
A -1	මුල් අවස්ථා අධිකරණ විනිසුරුවරුන්, දිසා විනිසුරුවරුන්, මහේස්ත්‍රාත්වරුන් සහ කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් බඳවා ගැනීම හා පත්කිරීම	100%			
A -2	අධිකරණ නිලධාරීන්ගේ හා කම්කරු විනිශ්චය සභාපතිවරුන්ගේ උසස්වීම්, වාර්ෂික වැටුප් වර්ධක, ස්ථාන මාරු කටයුතු සහ විවිධ ඉල්ලීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම	100%			
A -3	අධිකරණ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු හා නිවාඩු ගොනු පවත්වා ගැනීම	100%			
A -4	කම්කරු වන්දි කොමසාරිස් සහ නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් බඳවා ගැනීම, පත් කිරීම සහ ගොවිජන සමාලෝචන මණ්ඩල සඳහා හා පරිපාලන අභියාචන විනිශ්චයාධිකාර වැඩිහිටි නඩත්තු මණ්ඩලය සඳහා සාමාජිකයින් බඳවා ගැනීම හා පත්කිරීම	100%			
A -5	අධිකරණ නිලධාරීන් හා අධිකරණ පද්ධතිය සම්බන්ධ විවිධ වක්‍රලේඛ සැකසීම හා නිකුත් කිරීම	100%			
A -6	අධිකරණයන්හි පවතින නඩු පිළිබඳ සංඛ්‍යා ලේඛන ඊමේල් පණිවිඩ මගින් මාසිකව ලබාගෙන එම සංඛ්‍යා ලේඛන පරිගණකගත කිරීම, වාර්තා සකස් කිරීම හා විනිශ්චයකාරවරුන්ගේ වැටුප් වර්ධක සහ උසස්වීම් ලබා දීමේදී ඒ පිළිබඳ සලකා බැලීම.	100%			
A -7	උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ හා සංවර්ධන නිලධාරීන්ගේ, ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු හා සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු සිදු කිරීම	100%			
A -8	උපලේඛනගත නිලධාරීන් සම්බන්ධව ලැබෙන පැමිණිලි පිළිබඳ කටයුතු කිරීම	100%			
A -9	අදාල අධිකරණවල ඉල්ලීම මත නඩු කටයුතු සඳහා සංඥා භාෂණ පරිවර්තකයින් සහ විදේශ භාෂා පරිවර්තක සේවය සඳහා භාෂා පරිවර්තකයින් යොමු කිරීම	100%			
A -10	අධිකරණවල ඉල්ලීම මත සුදුසු පරිදි අධිකරණ භාෂණ පරිවර්තක සහ අධිකරණ ලඝු ලේඛක නිලධාරීන් අනුයුක්ත කිරීම	100%			

A -11	විනිසුරුවරුන්ගේ ඉල්ලීම මත සහ සේවා අවශ්‍යතා මත උපලේඛනගත නිලධාරීන්ගේ හා සංවර්ධන නිලධාරීන්ගේ තාවකාලික අනුයුක්තයන් සිදු කිරීම	100%			
A -12	කාර්යක්ෂමතා කඩඉම් විභාග 17ක් පැවැත්වීම		76%		
A -13	නව සේවා ව්‍යවස්ථාව අනුව බඳවා ගැනීමේ විවෘත/සීමිත තරඟ විභාග 15ක් පැවැත්වීම				26%
A -14	ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය මගින් මෙහෙයවනු ලබන භාෂණ පරිවර්තක නිලධාරීන් සඳහා පවත්වනු ලබන පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන්ගේ නම් නිර්දේශ කිරීම	100%			
A -15	දිවයිනේ පිහිටුවනු ලබන නව අධිකරණ සඳහා මු.රෙ. 71 අනුව අධිකරණ කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීම	100%			
A -16	මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සිට අධිකරණ පොත් බැඳුම්කරුවන් දක්වා විනය හා විමර්ශන කටයුතු		75%		
A -17	ලංකාව පුරා ඇති ක්වාසි අධිකරණ 65 හි පරිපාලන කටයුතු සිදුකිරීම (ක්වාසි විනිසුරුවරුන් බඳවාගැනීම හා ඔවුන්ට එරෙහිව එන පැමිණිලි සම්බන්ධව ක්‍රියාකිරීම)		75%		
A -18	දිවයිනේ සියලුම අධිකරණවල සහ මෙම කාර්යාලයේ සේවයේ නියුතු උපලේඛනගත සහ උපලේඛනගත නොවන රජයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් කටයුතු කිරීම			66%	
B -1	අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත අධිකරණ සේවය සම්බන්ධව එවනු ලබන පෙත්සම් පිළිබඳව ක්‍රියාත්මක වීම	90%			
B -2	තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ වූ කාර්යයන්	100%			
C -1	සාමාන්‍ය පරිපාලන සහ ගිණුම් කටයුතු පවත්වාගෙන යාම	100%			

4.2 2022 වර්ෂයේ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ආයතනයේ කාර්ය සාධන දර්ශක

ඉහත **4.1** මගින් පෙන්වා ඇති ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට අයත් **A, B** හා **C** යන දර්ශක වලින් වෙන් වෙන්ව නිරූපිත දර්ශක වල තථ්‍ය නිමවුම් වල සාමාන්‍ය, ප්‍රධාන කාර්යසාධන දර්ශක **03**ක් වශයෙන් සාරාංශ ගත කොට පහත දක්වා ඇත.

අංකය	දර්ශකය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තථ්‍ය නිමැවුම			
		100% - 90%	89% - 75%	74% - 50%	49% - 0%
A	අධිකරණ සේවා කොමිෂන් සභාවේ විෂය පථයට යටත් සහ ව්‍යවස්ථාදායකය මගින් බලය පවරා ඇති තනතුරු සඳහා බඳවා ගැනීම, පත්කිරීම, අනුයුක්ත කිරීම, ස්ථාන මාරු කිරීම, විනය හා විමර්ෂණ කටයුතු, වැටුප් වර්ධක, සේවයේ උසස් කිරීම් හා පුහුණු කිරීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.	-	89%	-	-
B	පොදු මහජනතාව අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන පැමිණිලි, තොරතුරු දැන ගැනීමේ පනත යටතේ සිදු කරන ඉල්ලීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.	95%	-	-	-
C	අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාන්‍ය පරිපාලනය සහ ගිණුම් කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.	100%	-	-	-

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
තිරසාර සංවර්ධනය උදෙසා සෑමට සාමකාමී හා සාධාරණ සමාජයක් ඇති කිරීම, සියලු දෙනාට සාධාරණත්වයත්, නීතියේ රැකවරණයත් ස්ථාපිත කිරීම, සියලු මට්ටම් වලින් වගවීම හා කාර්යක්ෂමතාවයෙන් යුත් යුක්තිය පසිඳලන ආයතන ස්ථාපිත කිරීම	ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම සහ සෑමට යුක්තිය සඳහා සමාන ප්‍රවේශයක් ඇති කිරීම හා සෑම මට්ටමකින්ම ඵලදායී, විනිවිද, වගවීමක් සහිත යුක්තිය පසිඳලන ආයතන ස්ථාපිත කිරීම	තොරතුරු දැන ගැනීමේ පනත මගින් ඉදිරිපත් කල ඉල්ලීම් ගණන හා ඒ සඳහා ප්‍රතිචාර ලබා දීමේ ප්‍රතිශතය	-	-	100%
		අධිකරණ නිලධාරීන් හා කාර්යමණ්ඩලය සම්බන්ධව ලද පෙත්සම් ගණන හා ඒ සඳහා ප්‍රතිචාර ලබා දීමේ ප්‍රතිශතය	-	-	80%
		නඩු කටයුතු සම්බන්ධව ලද පෙත්සම් ගණන හා ඒ සඳහා ප්‍රතිචාර ලබා දීමේ ප්‍රතිශතය	-	-	90%

අධිකරණ සේවා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පිළිබඳ සාරාංශය

6.1 අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල විස්තරය

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු/(අතිරික්ත) සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	15	09	06
තෘතියික	04	02	02
ද්විතියික	73	42	31
ප්‍රාථමික	25	10	15
කොන්ත්‍රාත් පදනම මත	-	-	-
මුළු සංඛ්‍යාව	**117**	**63**	**54**

6.2අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ හිඟ කාර්ය මණ්ඩල කළමනාකරණය පිළිබඳ විස්තරය

2022.12.31 දිනට අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ තථ්‍ය සේවක සංඛ්‍යාව 63කි. මෙම ලේකම් කාර්යාලයේ විවිධ තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව 54 ක් වන අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් 46% ක ප්‍රතිශතයක් ගනී. විවිධ තනතුරු සඳහා පවතින එම පුරප්පාඩු 54න් 29ක් අධිකරණ නිලධරයන්ගේ හා උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවට අයත් නිලධාරීන්ගෙන් පූරණය කර ගනිමින් රාජකාරී ඉටු කර ගැනීමට කටයුතු කර ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ කටයුතු තාවකාලික පරිශ්‍රයක පවත්වාගෙන යන බැවින් මෙම නිලධාරීන් පූරණය කරගැනීම මත වැඩිවන අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා ඉඩ පහසුකම් නොමැති බැවින් මෙතෙක් එම බඳවා ගැනීම් සිදුකර නොමැත.

6.3 මානව සම්පත් සංවර්ධනය

අධිකරණ වල සේවයේ නියුතු උපලේඛනගත නිලධාරීන් සඳහා පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් වල සාරාංශය 2022

අනු අංකය	පුහුණු වැඩසටහන	මාධ්‍යය	දින ගණන	පැවැත්වූ වැඩසටහන් ගණන	සහභාගී වූ නිලධාරීන් ගණන
1	කලාප පුහුණු වැඩසටහන් අනුරාධපුර කලාපය පොළොන්නරු කලාපය තංගල්ල කලාපය හම්බන්තොට කලාපය	සිංහල	02	02	108 97
			02	02	94 81
2	පුහුණු වැඩසටහන්	සිංහල	05	02	50
3	පවුල් උපදේශකවරුන් සඳහා පුහුණු වැඩසටහන්	සිංහල	04	02	76
මුළු එකතුව					506

(2022 වර්ෂය තුල රටේ පැවති **Covid 19** වසංගත තත්වය, මූල්‍ය ගැටලු සහ ප්‍රවාහන දුෂ්කරතා, හේතුවෙන් පැවැත්වීමට සැලසුම් කොට තිබූ පුහුණු වැඩසටහන් කිහිපයක් සැලසුම් කොට තිබූ පරිදි පැවැත්වීමට නොහැකි විය)

අනුකූලතා වාර්තාව

7. අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතා	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දින ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.6	වෙනත්	-		
2	**පොත් සහ ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල නොවේ	ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත	අධිකරණ සේවා කොමිෂන් සභා පැරණි ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ **(CIGAS)** පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය **(GA-N20)** යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රේ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		

3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත	අධිකරණ සේවා කොමිෂන් සභා පැරණි ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට **(NDB)** නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණන**			
6.1	මු.රෙ. **134(2) DMA/1-2019** අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත	අධිකරණ සේවා කොමිෂන් සභා පැරණි ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත	අධිකරණ සේවා කොමිෂන් සභා පැරණි ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත	අධිකරණ සේවා කොමිෂන් සභා පැරණි ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ	ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත	අධිකරණ සේවා කොමිෂන් සභා පැරණි ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
7	**විගණන හා කළමනාකරණ කමිටු**	-		

7.1	**DMA** චක්‍රලේඛ 1 – 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම	අනුකූල නොවේ	ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම හේතු කොට ගෙන අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොමැත	අධිකරණ සේවා කොමිෂන් සභා පැරණි ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛනයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මූදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ වාර්තා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	මාසික සාරාංශ වාර්තා සකස් කොට ඇති මුත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොමැත.	මින් ඉදිරියට නියමිත පරිදි සිදු කිරීම

9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාල නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			

11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 91(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අදාල නිලධාරියා සේවය හැර ගොස් තිබීම	ආයතන සංග්‍රහය සහ අදාල චක්‍රලේඛ අනුව අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අදාල නොවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අදාල නොවේ		
14	**අග්‍රිම ගිණුම**			

14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මූදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	හිඟ ආදායම් නොමැත		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		

16.2	කාර්යය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති **MSD** චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවත් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	-	චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීමට කටයුතු කරමින් පවතී.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	-	චක්‍රලේඛය අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය සඳහා ක්‍රමවේදයක් සකස් කරමින් පවතී.

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	කාර්ය සාධනය ඇගයීම සඳහා අධිකරණවල කාර්යක්ෂමතාවය සහ සඵලදායීතාවය ඉහළ නැංවීමට තුඩුදෙන වඩාත් ප්‍රායෝගික කාර්ය සාධන ඇගයීම් ක්‍රමවේදයක් යෝජනා කිරීම යන අරමුණු ඔස්සේ සමාලෝචනය කර වාර්තා කිරීමට මේ වන විට කමිටුවක් පත් කර ඇති අතර එහි කටයුතු අවසන් වූ පසු අදාල නිර්දේශ අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඒ අනුව සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත.
19.2	කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පූර්ණ අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	-	මානව සම්පත් සැලැස්ම සකස් කරමින් පවතී
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතය පදනම් කර ගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	-	මානව සම්පත් සැලැස්ම සකස් කරමින් පවතී
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		

20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		